# උයනෙකැ සිරිය ඇති පවුලෙකැ පිරිය

උයනෙකැ ඇති සිරියත් ගෙ-මිදුලෙකැ ඇති සිරියත් එක සමාන නො වේ. කො තරම් මල් පඳුරු සහ මල් පෝච්චි ආදිය හැඩ රුවට සකසා තිබුණත්, කිසි මැ ගෙ-මිදුලකට උයනෙකැ සොබා සිරිය ගත නො හැකි යැ.

අතු-පතර විහිදුණු, ගස් වැල් සහ ලතා මඬුලු වලින් සැදුණු උයනෙකැ දලු. කොළ, මල් මෙන් මැ පලවැල ද තිබීම සිරිත යැ. එ වන් හැම අයුරෙකින් මැ පොහොසත් වන නිසා, ගෙ-මිදුලකට ඇදෙන සමනල, මී මැස්සන් පමණක් නොව ගීත ගයන, සුරතල් පාන කුරුලු, කොබෙයි, ගිරා, මයින ආදී වූ විවිධ සියොතුන් ගෙන් ද උයනක් සැරැසී තිබීම සොබාවෙකි-සැබෑවෙකි.

එ තරම් මනරම් වූ උයනක් හා සම කිරීමට පවුලක් පෙරට ගත්තේ ඇයිදැයි සිතතොත් මා නිවැරදි යැ යි සතේ. පවුලක් වීමට අඩු මැ තරමින් මා-පිය දෙදෙන සහ දූ දරුවන් ද සිටියැ යුතුයැ. එය එසේ වෙතත් දරුවන් නොමැති පවුල් ද ඇති බව, හුදෙක් සානුකම්පිත වැ, සඳහන් කළ යුතු යැ. එ වැනි පවුලෙකැ මා-පියවරු සිටියැ නො හැකි යැ. එය පවුලක් ලෙස පිළිගන්නා නමුත්, එහි ඇත්තේ දෙමා-පියන් නොව අඹු සැමියන් යැ.

ඉතා වාසනාවන්ත පවුල් වලැ දෙ පසෙහි මැ දෙ මා-පියන් ද සිටිනු පෙනේ. එවන් පවුල් මිනිස් දිවියෙහි පිරිපුන් අවස්ථා ලෙස පිලිගත යුතු යැ. ඒ හා සමගාමී වැ උයනෙකැ සිරිය දකිතොත්, දලු, කොළ, මල්, පල සහිත ගසකට පිරිපුන් පවුල උපමා කළ හැකි යැ. එ වන් ගසක් දකින හැමට මැ සිතෙහි පිරිය උපදවන සේ මැ, පල දැරූ රුකෙකින් පරපුරක් බිහි වන අයුරු ද දැකැ ගැනීමට හැකිවෙයි.

මා පිය, දූ දරු පිරිස අතින් පිරිපුන් පවුලක් වූ පමණින් මැ එම ඇසුරෙහි පින්බර-සිරිබර ගතියක් පවතින්නේ නැත. මෙ දා ජන සමාජය දෙසැ බලන විටැ එය බොහෝ ප්‍රචලිත කරුණක් වී තිබේ. දෙ මාපියන් ගේ ඇසුර නො ලබන, දෙ මා පියනට ආහාර වේලක් දියැ නො හැකි තත්වයෙකැ සිටින දරු පවුල් වැඩි වෙමින් පවතිනු පෙනේ. එ වන් දරු පවුල් වලට මහ පරපුරේ දෙ මා-පිය සෙනෙහස, මඟ පෙන්වීම සහ සෙවණ නො ලැබීම නිරායාසයෙන් අත්වෙන අඩුවක්-පාඩුවක් වී තිබෙණු පෙනේ.

අපගේ මව් බිමෙහි වත්මන් ජන සමාජය දෙසැ බලන විටැ, විදෙස් රැකියා සඳහා දරු පවුල් පිටින් පිටත් වැ යන ප්‍රවනතාවය සීඝ්‍රයෙන් ඉහළ යනු පෙනේ. එහි අතුරු පලය වී ඇත්තේ දෙ මා-පිය ඇසුර නො ලැබී යාම යැ. විදෙස්වලැ අනුග්‍රහය ලබාගෙනැ, දෙ මා-පියන් ද විදෙස්ගත කර ගැනීමට ද සීමිත පහසු කමක් ලැබී ඇතත්, දෙ මා-පියනට තවත් දරුවන් පිරිසක් ඇති අවස්තාවලැ විදෙස් අනුග්‍රහය නො ලැබී යාම ද සිරිතකි. විදෙස්ගත දිවි පෙවෙතට ඇති නුරුස්නා ගතිය නිසා, දෙ මාපියන් විසින් සිය කැමැත්තෙන් මැ මව් බිමෙහි තනි වෙමින් වුවත් රැඳී සිටින අවස්ථාවන් ද අපි දුටුවෙමු. මෙවන් කවර අයුරින් සිදු වුවත්, සිරිලක් වැසියන් චිරාත් කාලයක් අත් විඳින ලද සීයා-ආත්තම්මා ගේ සෙනෙහස මතු පරපුරට අහිමි වී යමින් පවතින බව නො කියා බැරි යැ.

සියා-ආත්තම්මා නැති පවුලෙකැ ඇසට නොපෙනෙන, කටින් නොකියැවෙන අඩුවක් නිතර දැනෙයි. දෙමාපියන් වැඩ කටයුතුවලැ නිරත වෙද්දී හැදෙන-වැඩෙන දරුවන්ගේ එක මැ සැපත සීයා-අත්තම්මාගේ තුරුලෙහි නැලැවීමයි. ඒ අයුරු මැ මුණුබුරු-මිණිබිරියන් නැති පවුල් තුළැ ද කියා පැහැදිලි කළ නොහැකි හිදැසක් පවතියි.

තමාගේ දරුවනට දරුවන් නො ලැබීම තරම් දෙ මාපියන් ගේ සිත් පෑරෙන වෙනත් යමක් ඇතැයි මම නම් නො සිතමි. ඒ අනු වැ මැ දරුවෙකුට දරුවෙක් ලැබෙණ මොහොත තරම් සතුට දනවන වෙනත් මොහොතක් දෙ මා-පියෝ ද නො ලබති.

මේ සියලු කරුණු එක රැස් කරැ බලන විටැ, පරපුරු තුනෙක පිරිසක් ඇති පවුල දලු, මල්, පල වලින් සැදුණු රුකක් වැනි යැ. එවන් පවුල් වලින් සැදුණු සමාජය තුරු පිරි උයනක් බඳු යැ.

කළෙකට පෙරැ සිරිලකෙහි පැවැති විවාහ මඟුල් උළෙලක් වෙතැ ඔබගේ අවධානය ගෙන යනු රිසියෙමි. එහි දී නෙත් පිනන ඇඳුම්-ආයිත්තම් වලින් සැරැසුණු දෙමාපිය, දූ දරු, මුනුබුරු-මුනුබිරි පිරිස් එකතු වීම සිරිතක් සේ මැ සිදු වියැ. උත්සව අවස්ථාව වන විටැ දෙ පසෙහි නෑයන්ගෙන් ගෙදොර-දොර පිරී පැවැතුණි. දලු, කොළ, මල්, පල පිරි උයනෙකින්. පිරිපුන් පවුලෙකත් ඇති සමානත්වය අපි එහි දී දැකැ ඇත්තෙමු. කාලය පියඹා යන සේ මැ, සිරිත්-විරිත්, ගති-පැවැතුම් ද කාලය සමඟ මැ අනන්තයට ඉගිලී යන සැටි අපි දැකිමින් සිටිමු.



සිරිවිමල මුතුකුමාරණ
බැන්ඩිනොං

## පාළි පාඨ හෙළ බසින් 38

*"නං තං මාතා පිතා කයිරා*
*අඤ්ඤේවා'පි ච ඤාතකා*
*සම්මා පණිහිතං චිත්තං*
*සෙය්‍යසො නං තතො කරෙ"*

(ධම්ම පද 43-චිත්ත වග්ග නිමි)

මව් - පියවරුන් හෝ
වෙන නෑසියෙකු නො කරන
විලසින්, සුමහැ රැදි සිත
තමනට කරයි යහපත

*සිරිවිමල මුතුකුමාරණ - බැන්ඩිනොං*

## ලංකාවට භාණ්ඩ යැවීමේ දි වංචනිකයන්ට හසුවන්න එපා

ඕස්ට්‍රේලියාවේ වාසය කරන ඔබේ භාණ්ඩ (Unaccompanied Baggage) ශ්‍රී ලංකාවට නීත්‍යානුකූලව යැවීම සඳහා පත්කර ඇති නියෝජිතයන් (UPB Warehouse or Agent) පස්දෙනෙක් සිටිති, එනම් (Ceylon Shipping Line, Laksirisewa, MIDCO, Transco and Trico) යන ආයතන වේ. ඉන් බාහිරව විංචනික ලෙස භාණ්ඩ (Unaccompanied Gaggage) ශ්‍රී ලංකාවට යවන විට, රේගුව ඒවා අත්අඩංගුවට ගෙන දැඩි පරීක්ෂාවට ලක්කර, දඩ මුදල් අයකර ගැනේ. මේ හේතුව නිසා ඔබ යවන භාණ්ඩ නියමිත දිනට නොලැබී යයි. මෙය මීට පෙර අවස්ථා කිහිපයකදීම සිදුවී, භාණ්ඩ යැවූ ඕස්ට්‍රේලියාවේ වෙසෙන ලාංකිකයන් මහත් අපහසුතාවයට පත්වී ඇත. මේ දිනවලදීත් මෙවැනි වංචිනක ක්‍රියාවන්හි යෙදෙන කණ්ඩායම් කිහිපයක් සිටිති.

පළමුව මෙවැනි ව්‍යාජ ලෙස ලංකාවට භාණ්ඩ යවන පිරිස කරන්නේ ඕස්ට්‍රේලියාවේ වාසය කරන කිහිප දෙනෙකුගේ (පුද්ගලයින් 3-4) නම් අයතා ලෙස භාවිතා කරමින්, ඔවුන්ගේ ගමන් බලපත්‍ර දීමනාවන් ද (Passport duty allowance) ව්‍යාජ ලෙස භාවිතා කර, ලංකාවට භාණ්ඩ ප්‍රවාහණය කිරීමයි. දෙවනුව මේ මගින් ලංකාවට ලැබිය යුතු බදු මුදලක් මඟහැරියයි, නීත්‍යානුකූලව භාණ්ඩ ප්‍රවාහණයේ දී ශ්‍රී ලංකා රේගුවට නියමිත බදු මුදල් ගෙවීමට සිදුවේ, නමුත් මෙම වංචනික ක්‍රියාවේ යෙදෙන්නන්ගේ අරමුණ, ඒ බදු මුදල් ගෙවීම පැහැර හැර එමගින් ලාභ ලැබීමයි. මේ පිළිබඳව ලංකා රේගුවට තොරතුරු අනාවරණය වීමෙන් පසු ඔවුන් මේ ව්‍යාජ ආයතන සහ ඔවුන් යවන භාණ්ඩ දැඩි පරීක්ෂාවට ලක්කර ඇත. මේ හේතුවෙන් ඔබ ලංකාව යවන භාණ්ඩ ගැනීමේ දී දින ගණන් හෝ සතිගණන් ප්‍රමාද වීම් ද, විශාල දඩ මුදල් ගෙවීම හා අයතා ලෙස භාවිතා කරන ඔබගේ ගමන් බලපත්‍රය (Passport) නිසා නීතිමය කටයුතුවලට පවා මුහුණ දීමට සිදුවේ.

ඕස්ට්‍රේලියාවේ ජීවත්වන ඔබ නීති විරෝධි ක්‍රියාවලට සම්බන්ධ නොවෙති. ඒ හේතුවෙන් ලංකාවට භාණ්ඩ යැවීමේ දී නීත්‍යානුකූල ආයතන පමණක් තෝරාගන්න. තවද, එමඟින් ඔබ ලංකාවේ ආර්ථිකයට ද දායක වෙනවා ඇත. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ලාංකීය ප්‍රජාවගේ දැනගැනීම පිණිස මේ සටහන තබමු.

සුජීව මුණසිංහ
Melbourne


For all your Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833



Computer Repairs
For all your
Desktop/ Laptop
Computer Repairs and
Software problems
Call Chamath
0420 364 400